ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2248/63 - 2021 ඔක්තෝබර් මස 08 වැනි සිකුරාදා - 2021.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කළුතර දිස්ත්‍රික් මහ රෝහල, ශික්ෂණ රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කිරීම

2021.04.05 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් ගත් තීරණය අනුව, කළුතර දිස්ත්‍රික් මහ රෝහල, ශික්ෂණ රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කර වෛද්‍ය සිසුන්ට අදාල සායනික පුහුණුව සඳහා පහසුකම් සැපයීමට අවශ්‍ය මහාචාර්ය ඒකක පිහිටුවීම සඳහා එම රෝහල හඳුනාගෙන තිබේ. අමතර සායනික පුහුණුව සඳහා හොරණ සහ පානදුර මූලික රෝහල් තෝරාගෙන ඇත.

ඒ අනුව, මොරටුව විශ්ව විද්‍යාලයේ අභිනවයෙන් ස්ථාපිත වෛද්‍ය පීඨයේ සිසුන් සඳහා සායනික පුහුණුව ලබාදීමට වහාම ක්‍රියාත්මක වන පරිදි කළුතර දිස්ත්‍රික් මහ රෝහල, ශික්ෂණ රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කර නැවත වර්ගීකරණය කෙරේ. මොරටුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට අනුයුක්ත වෛද්‍ය සිසුන්ගේ සායනික පුහුණුව සඳහා පහසුකම් සැපයීමට මෙම රෝහල් ත්‍රිත්වයම තවදුරටත් සංවර්ධනය කෙරෙනු ඇත.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

අංක 385, සුවසිරිපාය
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

10 - 315

1A - G 35082 - 70 (2021/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*